01 ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් යනු කුමක්ද?

යම්කිසි පීඩාවක් හෝ යම් ක්‍රියාවක් සිදු කිරීම නැතිනම් දිගටම සිදුකරගෙන යන හේතුවෙන් යම් පාර්ශ්වයකට සිදුවන හානියක් වැළැක්වීමට එකී පීඩාව හෝ ක්‍රියාව සිදුකරගෙන යන්න වැළැක්වීම සඳහා ස්ථිර තහනම් නියෝගයක් නිකුත් කරන ලෙස පැමිණිලි පාර්ශ්වයට අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකිය. ඒ අනුව ඉන්ජන්ෂන් තහනම් නියෝගයකින් යම්කේ නොකරන ලෙසට නියෝග කරයි.

එහෙත් විශේෂිත අවස්ථාවලදී යම්කේ සිදු කිරීමටද ඉන්ජන්ෂන් තහනම් නිකුත් කරන අතර එවැනි නියෝග විධානාත්මක ඉන්ජන්ෂන් නියෝගය ලෙස හඳුන්වනු ලැබේ.

අතුරු ඉන්ජන්ෂන් යනු පාර්ශ්වයක් යනු නඩුවක් අධිකරණයේ විභාග අවසාන තීන්දුවක් ප්‍රදානය කිරීමට ප්‍රථම යම් පාර්ශ්වයක් විසින් කරනු ලබන යම් පීඩාවක් හෝ ක්‍රියාවක් මඟින් නඩුවක පාර්ශ්වයකට සිදුවන අලුතින්කාර හෝ පිරිහීසැසිය නොසෙසා හානියක් හෝ පාවුපත්, නඩුව විභාග අවසන් වනතුරු වළක්වා ගැනීමට ඇති නොතිබ සහනයකි.

02 රථවාහන වන්දි නඩුවක ස්වභාවය කෙබඳුද?

රථවාහන වන්දි නඩුවකදී අදාළ නඩු මුලුල ගෙවන ලෙස විසඳැරුවට, ලියාපදිංචි අයිතිකරුට සහ රක්ෂණ සමාගමට එන්නත්කරන් යනු නඩු සිදුකළ යුතුවේ. මෙසේ එන්තරාවාසි යැවීමේදී තමාට සිදු වූ හානියක් කෙසේ සිදුවූයේද? කුමක ගණනයන් මත යවන්නේද සහ ගෙවෙන වාරිතාද අමුණා යවන්නේ නම් බොහෝ විට නඩු පැවැරීමකින් හොරව රක්ෂණ සමාගම මඟින් වන්දි මුලු ප්‍රතිපූරණය කිරීමට අවස්ථාව සලසා ගත හැකිය. මෝටර් රථ වාහන පනතේ ප්‍රතිපාදන අනුව නඩු පැවැරීමට හෝ නඩු පැවැරීම දින සිට අවුම්ම තරමින් දින 7ක් අතුළත පැමිණිල්ලේ පිටපතක්ද සමඟ රක්ෂණ සමාගමට නොසිසි යැවීම අනිවාර්යය වේ.

රිය අනතුරු වන්දි නඩුවකදී වන්දි ලබාගත හැකි අවස්ථා පහත පරිදි වර්ග කරණය කළ හැකිය.

i) මෙවෙල වියදම් (අත්‍රිත, අනාගත, වර්තමාන, අනාගත, උපකාරක)

ii) ආදායම අහිමිවීම, ආදායම අඩුවීම, ලාභාංශ අඩුවීම, අනාගත ආදායම අහිමි වීම.

iii) මූල්‍යමය නොවන හානි

iv) ශරීරයේ සුවපහසුව හා සතුට අහිමි වීම.

v) වේදනාව හා වින්දනීම.

vi) ජීවිතයේ සුවපහසුව හා සතුට අහිමි වීම.

vii) ජීවිතය කෙටිවීම.

viii) විරූපව වීම.

ix) පසුව අසිහින සහායු ආබාධ

x) ස්ථාලු කම්පන සඳහා වන්දි

විනිසුරුවරයකු විසින් වන්දි ප්‍රදානය කිරීමේදී කළ යුත්තේ තමා පැමිණිලිකරුගේ තත්ත්වයට පත්වූයේ හෝ කුමනාකාරයේ පීඩාවක් වීදැයැ ගැනීමට සිදු වන්නේද යන්න සලකා බලා මිස පැමිණිලිකරුට විශාල මුදලක් වන්දියෙන් ප්‍රදානය කිරීමෙන් ඔහුට ලොතරැයි දිනුම්ක් ඇදුණා යන්න නොසලකයි. ඇතැම් අවස්ථාවලදී වන්දි ප්‍රදානය ඉල්ලා සිටින ගණකට වඩා ඉතා අඩු වන අතර එම්මගින් පෙනී යන්නේ අනාගත මූල්‍යමය හානි මේදැනාව හා වීදැරීම නොසලකා හැර වන්දි තීරණය කර ඇති බවයි. කෙසේ නමුත් අත්‍රිත සමාන වන විට වෙනත් අධිකරණයකදී කෙලෙස එම කාරණයට වන්දි ලබාදී ඇද්ද යන්න සලකා බලා එකඟතාවකින් යුතුව වන්දි ලබාදීම ඉතා වැදගත් වන නීතියේ පිළිගනී.

03 66 වගන්තිය යනු කුමක්ද?

සාමය කඩවන අන්දමේ ඉඩම් ආවුදු විසඳීම සඳහා 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණය විධිවිධාන සංශෝධනයේ vii පරිච්ඡේදය මඟින් කුමවේදයක් හඳුන්වා දී ඇත. මිනෙස්ලාත් අධිකරණයේ ලෙසු කාරිය පටිපාටිය යටතේ මෙම නඩු පවරනු ලබන අතර ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන් විසින් හෝ පොලිසිය විසින් 66 වගන්තිය යටතේ මෙම නඩු භොතු කළ හැකිය. ඕනෑම ඉඩමක් හෝ ඉඩමක කොටසක් හෝ එම ඉඩම පිහිටි ගොඩනැඟිල්ලක් පිළිබඳ සුක්ති අයිතිය පිළිබඳ එම මායිම් සම්බන්ධව ඕනෑම ඉඩමක් හෝ එහි කොටසක පවතින වගාවන් හෝ පදාදාන් පිළිබඳ අයිතීන්

ඉඩම සම්බන්ධව ඇති ඕනෑම ස්වභාවයක පරවශතාව යන කාරණා සම්බන්ධව ආරවුල් 66 වගන්තිය යටතේ භොතු කළ හැකි ඉඩම් ආරවුල් විය හැකි.

66 වගන්තිය යටතේ ඉල්ලීමක් සිදුකළ විට අධිකරණය සලකා බලනුයේ භුක්තියේ තිනම් පාර්ශ්වයන් සිටියේද යන්න පමණි. ඒ අනුව නියෝග නිකුත් කරනු ලබන අතර එකී නියෝගය මත එම දේපළවල ස්ථාවර සිම්කමක් නොලැබේ. සිමකම ලබා ගැනීම සඳහා සහ ඊට සම්බන්ධව අනෙක් කරුණු සඳහා දීසා අධිකරණයේ නඩු පැවැරිය යුතුවේ.

දෛනික ජීවිතයේදී මව්බිම පාඨකයන් පිඩාවට පත් කරන නීතිමය ප්‍රශ්න ගැන සෑම බදාදා දිනකම 'ගයිඩ්ලයින්' සහිතව පිළිතුරු ලබාදේ. නීති ආධාර කොමිෂන් විසින් එම පිළිතුරු කණ්ඩායමක් විසින් ලැබේ. විද්‍යවත් නීතිඥ කරුණු සම්පාදනය කරනු ලැබේ.

ඔබේ ගැටලුව මව්බිම 129, මහාධිකරණ සංකීර්ණය, කොළඹ 12, දුරකථන 011 2433618 හෝ අලුත්කඩේ, කොළඹ 12, දුරකථන 011 2433618 හෝ ඊමේල් legalaidcommission1978@gmail.com

වෙත යොමු කරන්න.

උපදෙස් සහ ලිපි සැකසුම
නීතිඥ දර්ශිකා මඩුගල්ලේ
නීතිඥ නිලූෂා කුමාර් විජේරත්න
නීති නිලධාරි
නීති ආධාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාර හා දේපළ නීතිය II කොටස

GUIDELINE

Right එක දැනගෙන Fight කරන්න

බෞද්ධ විහාර හා දේවාලගම් පනතේ අදාළත්වය පිළිබඳව සහ භාරකරුවන් තත් කිරීමට අදාළ වැදගත් කරුණු පිළිබඳව ගියවර පළ කරන ලද මාගේ ලිපිය මඟින් සාකච්ඡා කරන ලදී. සාංඝික දේපළක් යනු කුමක්ද යන්න පිළිබඳ වැදගත් කරුණු රැසක් ඇති අතර ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් අද දින ලිපිය මඟින් පාඨක ඔබ වෙත යොමු කරමි.

චාරිත්‍රානුකූලව පුජා කිරීමෙන් සංඝයාට කැප කළ දේපළ සාංඝික දේපළ යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම දේපළ භික්ෂූන් දේපළ හෝ වංචාල දේපළ විය හැකියි. මෙම සාංඝික දේපළ පූජා කිරීම සිදු කරනු ලබන්නේ හුදෙක් එක් භික්ෂුවකගේ අයිතිවාසි යටතේ නොව, සමස්ත සංඝයා වහන්සේලාගේම ප්‍රයෝජනය උදෙසා වේ. එනම්, මෙම සාංඝික දේපළෙහි අයිතිය යම් කිසි සංඝයා වහන්සේ කමකට හෝ සංඝයා වහන්සේලා කිසිවා සමඟ සම්බන්ධකම අතර ලාභබලාපොරොත්තු නැති කිසිකිසි දේපළ භුක්ති විඳීමේ හැකියාව පමණි. එසේම බුදුන්ට පිදූ දේපළ, විහාරයට පිදූ දේපළ ආදියට සාංඝික දේපළ තුළට යත හැකිය.

සාංඝික දේපළ ලැබෙනුයේ සියලුම සංඝයා වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා වන අතර එක් භික්ෂුවකගේ හෝ කිහිපදෙනකුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා නොවේ. මෙම දේපළ සාංඝික දේපළ යනුවෙන් හඳුන්වන්නේ එම නිසා වේ. සාංඝික දේපළක් සංඝයාට පූජා කිරීමේදී 'සංඝ යාණේ' ප්‍රයෝජනය සඳහා 'සංඝයාට' ආදී වචන යොදා ඇත. මෙහෙයින් අප්‍රමාණ වන්නේ සාංඝික දේපළකට හෝ අයිතිකරුවකු නැති බවත් එම දේපළ සියලු සංඝයා වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා දේපළක් පැවැරීමේ හැකියාව ඇති අතර එය සාංඝික කිරීමක් වශයෙන් හඳුන්වයි.

දේපළක් සාංඝික කිරීම අතීතයේ සිට පැවැත එන නීතිමය සහ චාරිත්‍රානුකූල තත්ත්වයක් බව අපගේ ඉතිහාසය විමර්ශනයට ලක් කිරීමේදී සොයා ගත හැකිය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලයේ ඇති ලෙන් ලිපිය, අම්පාර දිස්ත්‍රික්කයේ කෝගල්ලු ප්‍රදේශයේ තිබෙන ලිපිය, හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිතුල්පව්ව, කොරවක්ගල පිහිටි ගුහා ලිපි, කෝගල්ල ගුහා ලිපිය, පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ටාම් ලිපිය මීට සාක්ෂි දරයි. මෙකී විස්තරා මඟින් අතීතයේ දේපළ සාංඝික කර ඇති බවත්, එසේම එකී පැවැරීම කරන ආකාරය සහ ඒවා ආරක්ෂා කරන ආකාරය විශාල කර ඇත.

යම් දේපළක් සාංඝික කරනවාද එය ගිහි සන්තක දේපළක් ලෙස පවතිද? දේපළක් සාංඝික කිරීම මුළු සංඝයා වහන්සේලා නියෝජනය කරන ලබන භික්ෂූන් හෝ රාජකීය ගණනක් ගෝරවය වන වැඩි ගණනක් ඉදිරියේ විධිමත් චාරිත්‍රානුකූල ක්‍රමයක් මඟින් කරනු ලබයි. සාංඝික දේපළක් පවරන අවස්ථාවේදී තනක දායක හා තනාන්ලාගේ සිරිත පවත්වමින් සරල ඇඳවස්ත්‍රයක් පරිදි ගෞරවය සලකා ඇඳවස්ත්‍රයක් සිරිත යුතුය. මෙහිදී භික්ෂූන් හතර දෙනකු සංඝෝත්තර කරන්නේ, සියලුම සංඝයා නියෝජනය කිරීම සඳහා වේ.

කෙසේ වුවද කිඹේල දේපළක් පවරේ යම් භික්ෂූ කොටසකට පවාර පූජා කිරීමටද කිසිගෙන ඉඩ ලැබේ. දේපළක් සාංඝික කිරීමේ අදාළව යම් නිශ්චිත වූ වාචිතක් තිබිය හැකිය. කෙසේ වුවද යම් දේපළක් සාංඝික කිරීමේ අදාළව යම් නිශ්චිත අරමුණක් හෝ ක්‍රියාවක් අදාළ චාරිත්‍රයක් සමඟ තිබිය යුතුය. තනතාලාභියාගේ අතර අතපසක් වන් කිරීම මෙවැනි චාරිත්‍රයකි. ගිහි සන්තක දේපළක් සාංඝික දේපළක් බවට පත් වන්නේ ඕක් අතතුරටයි. මේ ආකාරයේ චාරිත්‍ර විධියක් අනුගමනය කොකට දේපළක් සාංඝික බවට පත් කළ හොතකැකිය. එසේම දේපළක් සාංඝික කිරීම මත්ප්‍රපාක් මඟින්ද සිදු කළ හැකි අතර අතීතයේදී නම් ගල්වල කෙටම මඟින්ද දේපළ සාංඝික්‍රණය කළ හැකිය.

මෙම සාංඝික ක්‍රමය අනුමගමනය කරනු ලබන්නේ විනය කිතිවලට අනුකූලව වේ. දේපළක් වන්දනාමාන කිරීම සඳහා වේ නම් කර තැබූ පමණින් එම දේපළ සංඝයා වහන්සේලා සඳහා කැප කළ සාංඝික දේපළක් වන්නේ නැත. නිශ්චිත දේපළක් සාංඝික කිරීමේදී එය පෙර සඳහන් පරිදි චාරිත්‍රානුකූල පැවැත්මක් මඟින් කර ඇති නම් එය සාංඝික වේ. ඒ සඳහා හොකාරීස්වරයකු සහභාගි කරන දෙද භික්ෂූවක් සිටිම හෝ වංචා වැළැක්වීමේ අදාළ පනත අනුගමනය කිරීම අනිවාර්ය වන්නේ නැත. යම් භික්ෂුවක් සහ මිනිස්සු දෙදෙනක් උපසාගත් තමාගේම ප්‍රයෝජනය සඳහා තබා ගත් දේපළ පෞද්ගලික දේපළක්ක වශයෙන් ගැනීමට විනය නීති මඟින් ඉඩදී ඇති අතර මෙසේ භික්ෂූවක් තබාගන්නා පෞද්ගලික දේපළ ඉතිරිව තබා යම් භික්ෂූවක් අපවත් වීමෙන් පසු එම දේපළ සාංඝික දේපළක් බවට පත්වේ. එසේත් භික්ෂූන් වහන්සේ කෙනකු උරුම කරගත් දේපළ මේ ආකාරයට සාංඝික දේපළක් බවට පත් කොවන බව පනතේ 23 වැනි වගන්තිය මඟින් දක්වා ඇත. එසේම බෞද්ධ භික්ෂූන් වහන්සේලා ගම්වල්කරු ගම් දේපළක් දීර්ඝකාලයක් තිස්සේ පොදුවේ භුක්ති විඳමින් නම් එම දේපළ සාංඝික දේපළක් වන බවට පූර්ව නිගමනයක් වෙති.

මෙසේ භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා පත්කලද ඇති සාංඝික දේපළ හා ඉන් ලැබෙන ආදායම එම භික්ෂූන් වහන්සේලා විසින් පරිහරණය කළ යුතු ආකාරයද නීතිගේ පෙන්වා දී ඇත. පනතේ 25 වැනි වගන්තිය මඟින් දක්වා ඇති ආකාරයට පනත සඳහන් අවශ්‍යතාවන් සඳහා සාංඝික දේපළ හා ඉන් ලැබෙන ආදායම යෙදවිය හැකිය.

(i) පන්සලේ අනුශාසවරියාන් කිරීම සඳහා.

(ii) පන්සලේ වැඩ වසන භික්ෂූන් වහන්සේලාගේ හා පරිපාලන නිලධාරීන්ගේ හඳවත්තුව සඳහා.

(iii) පන්සලේ ආගමික කටයුතු සඳහා සහ සාම්ප්‍රදායික ආගමික උත්සව සඳහා.

(iv) අධ්‍යාපන කටයුතු දියුණු කිරීම සඳහා.

(v) දේවාලයක් සහ ගෝවිලක් සම්බන්ධයෙන් වන විටක එකී දුපී අයගේ යහපතට හේතුවන කටයුත්තක් සඳහා.

(vi) භික්ෂූන්ගේ සද්කාරය සඳහා.

(vii) සාංඝික දේපළක් හෝ පන්සලේ කටයුතු වෙනුවෙන් නීතිමය කටයුතු සඳහා කරන වියදම් වෙනුවෙන්.

(viii) බෞද්ධ විහාර හා දේවාලගම් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන වියදම් සඳහා.

(ඩැ) බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් විසින් අනුමත කරන ලද කෙනකුන් වියදම් සඳහා.

එසේම පන්සලගේ අයිති වූ හෝ අයිති වන හෝ එම පන්සලේ ප්‍රයෝජනය සඳහා කොට තිබෙන හෝ පන්සලේ ප්‍රයෝජනය සඳහා වෙන්කොට තිබෙන හෝ සියලුම වංචල හෝ නිශ්චල දේපළ හා එම දේපළ මඟින් ලැබෙන අනෙකුත් සියලුම කුලී ලාභ ඒ අවධියේ එම පන්සලා භාරව සිටින භාරකරු මෙන හෝ පාලක විහාරාධිපති වෙත පැවරෙන බව පනතේ 20 වන වගන්තියෙන් පැහැදිලි කර ඇත.

1938 අංක 39 දරන උඩරට නීති සංශෝධන හා ප්‍රකාශන ආඥා පනතේ 5 වැනි වගන්තිය අනුව උඩරට නීතියට යටත් වන පුද්ගලයකු විසින් පන්සලකට දෙන දල තනාගයක් තනාග දීමනාකරුට අවලංගු කළ හොතකැය. උඩරට නීතිය අනුව 'තනාගයක්' යනු මූල්‍යමය වටිනාකමකින් හෝ මූල්‍යමය ප්‍රතිඝෝචනයින් හොරව ජීවිත කාලය තුළ ස්ථ කැබැල්ලකෙන් දෙනු ලබන තිබේලය දේපළ පැවැරීමකි.

මේ අනුව ඉහත කී විධිවිධාන යටතේ පන්සලක පාලක විහාරාධිපති හෝ භාරකරු වෙත පැවැරී ඇති ඕනෑම තනාගයක් තනාග දීමනාකරු විසින් අවලංගු කිරීම නීතානුකූල හොවන බව සඳහන් කළ හැකිය.

පන්සල්වල තිබූ දේපළ කිරවැල් කිරීම සඳහාත් ඒ සම්බන්ධ විධිවිධාන යෙදී ඇත. සඳහාත් එම පනතේ 02 වන වගන්තිය යටතේ මූල්‍යමය කොමසාරිස්වරයකු විසින් එම පනතේ 07 වගන්තියට අනුව උඩරට ප්‍රදේශයේ තිබෙන ඕනෑම දිස්ත්‍රික්කයක පිහිටා තිබෙන විහාර හා දේපළ සතු සියලුම ඉමිමිවල මායිම් නිවැල් කර තීරණය කළ යුතු වීය. මෙය අදාළ වූයේ මෙම පනතට අනුව උඩරට ප්‍රදේශයේ පිහිටි විහාර දේපළවලට පමණි.

මීට හේතුව වන්නට ඇත්තේ එකල බොහෝ විහාර දේපළ උඩරට පිහිටා තිබීම විය හැකිය. පන්සල් විහාර සතු ඉඩම් පිළිබඳව මායිම් නිවැල් කිරීමෙන් පසු මෙම ඉඩම් ලියාපදිංචි කිරීම කළ යුතුය.

කොමසාරිස්වරයා විසින් එවැනි තත්ත්වයක් සතු දේපළක මායිම් නිවැල් කර තීරණය කරගත් පසු ඔහු විසින් ඒ සම්බන්ධයෙන් ඒ තොරතුරු ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාරයක් සාදා තිබිය යුතු අතර එම රෙජිස්ට්‍රාරයේ එම ඉඩමේ විස්තරය, එහෙම් එකී පිහිටීම, මායිම්, ප්‍රමාණය හා එම ඉඩමේ මායිම්වල පිහිටා ඇති ඉඩම් පිළිබඳ විස්තරයක් අඩංගුවේ කළ යුතුය.

මේ ආකාරයට විහාර හා දේපළ ලියාපදිංචි කිරීමේ පටන් ප්‍රතිඵලයක් වූයේ මෙම දේපළ වර්ගවල නිදසන් කිරීමයි. වර්ගවල නිදසන් කිරීම සඳහා සාක්ෂියක් ලෙස ඉදිරිපත් කිරීම සිමුන්ස නිධානයකට අනුව සහතිකයක්ද භික්ෂූන් කරන ලදී. මේ වන 1856 අංක 10 දරන බෞද්ධ විහාර ඉඩම් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 07 වැනි වගන්තියෙහි සඳහන් කර ඇත.

නීතිඥ
ගංගා ජයාංගනී සෝමරත්න
නීති නිලධාරි ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

පාස්කු ඉරිදා ප්‍රහාරය සහ ජාතික ආරක්ෂාව ගැන පාර්ලිමේන්තු විවාදය 21-22 දිනවලදී

අනුරාධා හේරත්, ක්‍රිෂාන් පතිරන් ජයසූරිය

පාස්කු ඉරෙදින ප්‍රහාරය හා වත්මන් ජාතික ආරක්ෂාව පිළිබඳ සභාව කල්තැබීමේ විවාදයක් ඉබව 21 සහ 22 යන දෙදින පුරා පැවැත්වීමට තීරණය කර තිබේ.

පසුගිය 9වැ කථානායක මහින්ද යාපා අබේවර්ධනගේ ප්‍රධානත්වයෙන් පැවැති පාර්ලිමේන්තු කාටලුතු පිළිබඳ කාරක සභාවේදී මේ බව තීරණය වී තිබේ.

පාර්ලිමේන්තුව එළැඹෙන 19 වැනි අඟහරුවාදා සිට 22 වැනි සිකුරාදා දක්වා රැස්වීමට තියමිත අතර සැප්තැම්බර් 19 වැනි අඟහරුවාදා සෙ.10 සිට සෙ.5.00 දක්වා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ තියෝග සහ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ අංක 2334/47 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති නියෝග විවාදයට ගැනීමට නියමිතය.

සැප්තැම්බර් 20 වැනි බදාදා සෙ.10 සිට ප.ව 5.00 දක්වා (451 වැනි අධිකාරිය වූ) වන සංරක්ෂණ ආඥා පනත යටතේ අංක 2346/02 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති නියෝග විවාදයට ගැනීමට නියමිත අතර සැප්තැම්බර් 21 බ්‍රහස්පතින්දා සහ 22 සිකුරාදා සෙ.10 සිට ප.ව 5.30 දක්වා පාස්කු ඉරෙදින ප්‍රහාරය හා වන්නේ ජාතික ආරක්ෂාව පිළිබඳ විවෘතෂය විසින් හෙන එන සභාව කල් තැබීමේ විවාදය පැවැත්වීමට නියමිතය.

ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ ගැටලු සොයන්න විදෙස් සේවාව රුසියාවට යයි

අමින් මධ්‍රංගය ගමගේ

රුසියාවේ ඇඟලුම් කර්මාන්තශාලාවලදී හා සත්ත්ව ගොවිපළවලදී ගැටලුවලට මුහුණ දී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් පිළිබඳව සොයා බැලීමට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බිලධාරීන් කණ්ඩායමක් එම රටට ගොස් තිබේ.

ශ්‍රමිකයන් බලවා ගනන් ආයතනවල කළමනාකරුවන් හමුවී කසාවේණ කොට ගැටලු සඳහා විසඳුම් ලබාදෙන ලෙස මෙම නියෝජිත පිරිසට උපදෙස් ලබාදී තිබේ. ඇතැයි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පැවසීය.

රුසියාවේ සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ වැටුපෙන් කොටසක් මුදල් වශයෙන් අය කිරීම, විධිමත් අනුරක්ෂ මුදල් දීමනියට ලක්වීම සඳහා කරන්නේ කොළඹ වරාය ඇතුළු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පැවසීය.

මෙම කරුණු අනාවරණය වීමෙන් අනතුරුව රුසියාවේ රැකියා සඳහා ස්වයං මාර්ගයෙන් ශ්‍රමිකයන් යොමු කිරීම සාධාරණීකරණ අන්තිමවූ බවද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහන් කළේය.

ගැටලුවලට මුහුණ දී සිටින මෙම ශ්‍රමිකයන්ට සහ රැකියා අවස්ථා ලබාගෙන්මි පිළිබඳව නියෝජිත කණ්ඩායම රුසියාවේ බලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට නියමිත බවද එම කාර්යාංශය පැවසීය.

රුසියාවේ සංවාරයේ නිරත වූත පිරිසට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී (ජාතික්කර කටයුතු) එම්.ආර්.සී.ඩී ඒකනායක, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයේ වන පී.පී. වීරසේකර, ප්‍රියංකා රත්නසිංහාරච්චි එක්ව සිටිති.

සාමාන්‍යයෙන් බෞද්ධ භික්ෂුවකට පෞද්ගලිකව දේපළ ලැබීම කළ නොවේ. ඔවුහු ගිහිගෙය හා ලෞකික සැප සම්පත් අත්හරින්නෝ වෙති. නමුත් භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා දේපළක් පැවැරීමේ හැකියාව ඇති අතර එය සාංඝික කිරීමක් වශයෙන් හඳුන්වයි.

නැපෑලෙන් එවූ කෝටි 8ක මත්ද්‍රව්‍ය නැපෑල් තක්සේරුවේදී අත්අඩංගුවට

අමිල අබේරත්න

මෙම වසර තුළ කොළඹ තැපෑල් තක්සේරු කාර්යාලයේදී කෝටි 8ක අධික වටිනාකමකින් යුත් මත්ද්‍රව්‍ය පාර්සල් අත්අඩංගුවට ගෙන ඇති බව රේගුව සඳහන කරයි.

රේගුව විවිධ ප්‍රලිපත්තන් සහ පුද්ගලයන්ට එවන ලද පාර්සල් තුළ තිබී එම මත්ද්‍රව්‍ය පාර්සල් අත්අඩංගුවට ගෙන ඇති අතර ඒවා අතර අයිස් හමැරිකි මෙන්වූ, එකරාසි හමැරිකි මෙතෙන්පිටරියින් අඩංගු මත්පෙත්ති, කුෂ් හමැරිකි ගංජා වීජෙශය, 'මැජික් මෂ්රූම්' හමැරිකි මත්ද්‍රව්‍ය තිබූ බව රේගුව සඳහන් කරයි.

කොළඹ තැපෑල් තක්සේරු කාර්යාලයේ නිලධාරීන් විසින් එම අත්අඩංගුවට ගැනීම් සිදු කර ඇත.

සමහර පාසල්වල සිසු සංඛ්‍යාව 5000ත් පැහැලා සනීපාරක්ෂක පහසුකම් නැහැ

දොරවල් නැති කාන්තා වැසිකිළි

අනුරාධපුර නගර සභා සීමාවේ පාසල් නියාමනය කරන්න නගර සභාවේ සූදානමක්

චූලු බණ්ඩාර කුලසේකර

අනුරාධපුර නගර සීමාවේ ඇති සියලුම පාසල් නියාමනය කර, එම නියාමනයන් කඩ කරන්නේ නම් අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර මහ නගර සභා ආඥා පනතට අනුව නීතිමය පියවරක ගන්නා බව අනුරාධපුර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් රුවන් විජේසිංහ සඳහන් කරයි.

අනුරාධපුර නගර සීමාවේ ක්‍රියාත්මක පාසල් අතුරින් තනි පාසලක පාසල් දාරුවන් 4000 සිට 6000 දක්වා සිටීම දාරුවන්ගේ සෞඛ්‍යයට මෙන්ම මානසික ආතතියට හේතුවක් වී තිබේ. එමෙන්ම සනීපාරක්ෂක පහසුකම් සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පැවැතීමද දාරුවන්ට කෘෂ්ඨම බලපාන්නකි.

විශේෂයෙන්ම පන්සිය කාමරයක සිටිය යුතු ළමයින් සංඛ්‍යාවට වඩා සිටින අතර ළමයි පහනකට (50) වැනියෙන් පන්සිඳිල සිටින පාසල් ද ඇත.

මේ දරුවන්ගේ ඉගෙනුම් කටයුතුවලට මෙන්ම ඇස් පෙනීමේ දුර්වලතා ඇති කිරීමට බලපාන ආලෝකය, පිරිසුදු වාතාශය හොඳින් වීම, ළමයින් පොරපීම ඉතා මානසික ආතතිය ඇති වීම ආදිය ප්‍රධාන තානක් ගනියි.

සනීපාරක්ෂක පහසුකම් අතර වැසිකිළි කැසිකිළි ආදී අංශ සෙරෙහි වඩා අවධානය යොමු නොවී තිබීමද ගැටලුවක් බව නාගරික කොමසාරිස්වරයා පෙන්වා දෙයි.

සමහර පාසල්වල කාන්තා වැසිකිළි තුළ දොරවල් පවා හොඳින් ගංජා වීජෙශය, 'මැජික් මෂ්රූම්' හමැරිකි මත්ද්‍රව්‍ය තිබූ විදුහල්පතිවරයා හෝ විදුහල්පතිවරය දැනුවත් කර අඩණ්ඩව සිදු කරන පසු විපරමකින් අතහරුවන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

අනුරාධපුර මධ්‍ය විද්‍යාලය, ස්වර්ණපාලි බාලිකාව, වලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලය, නිවන්තගේවිය විද්‍යාලය, මහින්ද ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය, ඩී. එස්. සේනානායක ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය, ශාන්ත ජෝසප් පිරිමි විද්‍යාලය, විමලධර්මතන්ද විද්‍යාලය, සමිරා විද්‍යාලය සිසුන් දහස් ගණනින් යුතු පාසල් අතර ප්‍රමුඛස්ථානයක් ගනියි.